# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,986 — 1962 මාර්තු 16 වැනි සිකුරාද — 1962.3.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 461 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 461 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 463 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 464 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | — |
| " සුරාබද්ද ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 107**

අංකය : සී. 1/රෙක්ව/43.

### යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ඇතුළත් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා අනු පිළිවෙලින්, ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් සඳහන් කරන ලද දින සන්ධි සිට හා රෙජිමේන්තු/බලකාවලට ඇතුළත් කොට තිබේ:—

උප ලුතිනන් පාදුක්කගේ නිහාල් බෘයන්ට් බෙන්හම් විජේසේන—ලංකා සිංහ රෙජිමේන්තුව, 1961 ජූනි මස 3 වැනි දින සිට.

උප ලුතිනන් දේවගේ එලායස් කත්‍රිආරච්චිගේ දොන් ලයනල්—ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය, 1962 ජනවාරි මස 22 වැනි දින සිට.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 පෙබරවාරි 26 වෙනිදා,
කොළඹදීය.

3-520

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 108**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය:—

අංකය : ජේඑෆ්. 23/48.

එන්. ක්‍රිෂ්නදාසන් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මාර්තු 3 වැනි දින සිට, යාපනේ දිස්ත්‍රික් උසාවියේ අංක ඊ/783 දරණ නඩුවේ තීන්දුව දීමට, යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑෆ්. 26/48.

ඩබ්ලිව්. ඩබ්ලිව්. මුතු රාජා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 අප්‍රේල් 3 වැනි දින සිට, කළුතර දිස්ත්‍රික් උසාවියේ අංක 6574/36188 දරණ අපරාධ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, කළුතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා 1962 පෙබරවාරි 22 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කුරුණෑගල, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

---

සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

---

461—ජේ. අ. ඕ 41704—4,831 (3/62)

අංකය : පීඑල්/එච්. 5/56.

සී. බී. හුනුකුඹුර මහතා නැති අතර, ඩී. පී. බී. මහදිවුල්වැව මහතා 1962 මාර්තු 1 වැනි දින, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තමන්කඩුව හා කලාගම් පලාත්වල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා දකුණු හුරුළු පලාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 9/61.

ඒ. එම්. එම්. අලහුදීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. කුමාරනායගම් මහතා 1962 මාර්තු 5 වැනි දින සිට 7 වැනි දින දක්වා හා 9 වැනි දිනද, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා කඩ්ඩුකුලම් හා තම්පලාකාමම් පත්තුවල ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 2/48.

ඒ. එස්. හේරත් ගුණරත්න මහතා නැති අතර, එස්. එච්. අබ්දුල් කාදර් මහතා 1962 පෙබරවාරි 24 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ සහ දඹදෙණි හත් පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑ්ඒ. මිශ්‍ර/57.

එස්. එච්. අබ්දුල් කාදර් මහතා 1962 මාර්තු 2 වැනි දින, පිලැස්ස ගම්බද උසාවියේ අංක 1648/පී දරණ අපරාධ නඩුව ඇසීමට, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැළඹිලි හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑ්ඒ. මිශ්‍ර/57.

එම්. ඒ. ඊ. බී. පෙරේරා මහතා 1962 පෙබරවාරි 28 වැනි සහ 1962 මාර්තු 1 වැනි දින සිට 3 වැනි දින දක්වා, 5 වැනි දින සිට 7 වැනි දින දක්වා. 9 වැනි, 10 වැනි, 12 වැනි දින සිට 17 වැනි දින දක්වා, 19 වැනි දින සිට 24 වැනි දින දක්වා, 26 වැනි දින සිට 31 වැනි දින දක්වා, හෝ නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයට හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/යූ. 2/48.

ජේ. ඩබ්ලිව්. බී. උඳලාගම මහතා නැති අතර, පී. එස්. මහලේකමේ මහතා 1962 මාර්තු 1 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ නුවර, උඩපලාත, උඩබුලත්ගම සහ යටිනුවර, ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/වයි. 3/51.

එන්. එම්. යූසුෆ් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. බී. සිරැක්ස් මහතා 1962 පෙබරවාරි 27 වැනි දින සිට 1962 මාර්තු 2 වැනි දින දක්වා, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල් බොඩ, කිනිගොඩ, බෙලිගල් සහ පරනකුරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑ්ඒ. 53/57.

ඒ. සේනානායක මහතා 1962 මාර්තු 16 වැනි දින, දෙහිඕවිට ගම්බද උසාවියේ අංක 4,842 දරණ අපරාධ නඩුව ඇසීමට. අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ සහ පාත බුලත්ගම සහ ඇතුළුගම් සහ පනාවල් කෝරලයන්හි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට හා බෙලිගල් සහ කුරුවිට කෝරලයන්හි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑ්ඒ. මිශ්‍ර/57.

එම්. එම්. පෙරේරා මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින අතර, එස්. එච්. අබ්දුල් කාදර් මහතා 1962 මාර්තු 15 වැනි හා 28 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා වන්නි හත් පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තු වේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

එස්. ආර්. විජයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 මාර්තු මස 7 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

3-601

## වෙනත් පත්කිරීම් ආදිය

1962 අංක 109/2

### ගැසට් නිවේදනයයි

මගේ අංකය : ඒඅයි 3/1/62.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ (20 වෙනි පරිච්ඡේදය) 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් —

1962 පෙබරවාරි මස 20 වෙනි දින සිට, කේ. මීරා මොහිදීන් මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ විදත්තල්තිව් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එස්. පොන්නයියා මහතාද,

1962 පෙබරවාරි මස 20 වෙනි දින සිට, ඇල්. ඒ. ආර්. එච්. අන්සාරි මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඩී. ඇම්. අබේසේකර මහතාද,

1962 පෙබරවාරි මස 23 වෙනි දින සිට, කේ. වෛත්‍යලිංගම් මහතා නැවත වැඩ භාරගන්නාතුරු, යාපනය දිස්ත්‍රික්කයේ කයිට්ස්හි අනලායිතිව් එළුවාතිව් කොට්ඨාශයන්හි හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට අයි. නඩරාජා මහතාද,

1962 පෙබරවාරි මස 23 වෙනි දින සිට, ජේ. සී. වීරකෝන් මහතා නැවත වැඩ භාරගන්නාතුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල නාගරික ප්‍රදේශයෙහි හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඇස්. ඇම්. අභයරත්න මහතාද,

1962 පෙබරවාරි මස 23 වෙනි දින සිට කුරුණෑගල දිස්ත්‍රික්කයේ නැගෙනහිර හතලිස්පහ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ආර්. පී. කදුරුවැව මහතාද,

1962 පෙබරවාරි මස 28 වෙනි දින සිට, අළුත් පත්වීමක් කරන තුරු මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ඇල්. බී. අත්තනායක මහතාද,

පත්කර ඇත්තේය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
සථිර ලේකම්.

1962 මාර්තු මස 9 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

3-454

1962 අංක 110

### ගැසට් නිවේදනයයි

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින් —

1. ජී. අමරසිංහ මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන්

පත්කර ඇත්තේ ය.

1947 සැප්තැම්බර් මස 18 වෙනි දින අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ ප්‍රකාශයකින් සංශෝධිත සිවිල් නඩු විධාන සංග්‍රහයේ 372 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 371 වෙනි වගන්තියේ සඳහන් දිවුරුම් පත්‍ර පිළියෙල කිරීමට අවශ්‍යවන සහතික කිරීම් හෝ දිවිරීම් හෝ කරවීමට විශේෂයෙන් බලය පවරා ඇති නිල ධාරියෙකු වශයෙන් ජී. ඊ. ජයසූරු මහතා මාතලේ ෆිස්කල් මාර්ෂල්තැන වශයෙන් වැඩබලන කාලයතුල මාතලේ අධිකරණ කොට්ඨාශය සඳහා

පත්කර ඇත්තේය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
සථිර ලේකම්.

1962. මාර්තු මස 12 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

3-455

ජේරාඩ් මැදප්පුලි 1947 දී දලක් සහ යාත්‍රාවක් මිලදී ගෙන 1947 මාර්තු 28 වෙනිදා පටන් මාදලක් යොදා මසුන් මැරීම ඇරඹුවේය. එවිට ඇස්. ඩී. ඒබ්‍රහම් ගේ පුත්‍රයින් වන පැට්රික් සහ ඔහුගේ සහෝදරයෝ, මසුන් මැරීමට ජේරාඩ් මැදප්පුලිට ඇති අයිතිවාසිකම ගැන ආරාවුල් කළෝය. 1948 ජනවාරිවලදී මැදප්පුලි, සතියකට දින තුනක් මසුන් මැරීමට අයිතිවාසිකම් ඉදිරිපත් කර ඔහුගේ මසුන් මැරීම වැළැක්වෙන සෑම දිනයකටම රු. 150 බැගින් වූ වන්දියක් ඉල්ලමින් පැට්රික් ජුවාන් සහ ඇන්ඩෘ යන අයවළුන් හට විරුද්ධව කළුතර දිස්ත්‍රික් උසාවියේ අංක 26779 දරණ නඩුව පැවරුවේය. විත්තිකරුවෝ, මාදැල් එලීමේ සම්පූර්ණ අයිතිවාසිකම් ඔවුන්ගේ පිය මුතු පරම්පරාව සහ ටී. ඇම්. ආර්. කුරේ සතුවී යැයි කියා සිටියෝය. (අයි. සී. 2). ජේරාඩ් මැදප්පුලි හට මාදලක් යොදා මසුන් මැරීමට අයිතිවාසිකමක් ඇතැයිද ඔහුගේ මසුන් මැරීමේ වාරය ඔහුත් විත්තිකරුවනුත් අතරේ නියම කරගත යුතුයැයිද දිස්ත්‍රික් උසාවියෙන් තීන්දුවිය. (අයි. සී. 5). අභියාචනයෙහිදී ශ්‍රේෂ්ඨාධිකරණය, විත්තිකරුවන් ගත් මඟ අභිනයෝ පදනමකින් යුක්ත යැයිද ඔවුන් හා කුරේ අතරේ බෙදා ගන්නා ලද තනි භුක්තියට තවදුරටත් ඉඩදිය නොහැකියැයිද තීරණය කර තීන්දුව පහත සඳහන් ලෙස වෙනස් කළාය.

(1) සතියකට දින 3 ක දී මාදලක් යොදා මසුන් මැරීමේ තනි අයිතිවාසිකමක්, පැමිණිලිකරුට හිමි නොවන අතරම විත්තිකරුවන් හටද කුඩාව වරායෙහි මසුන් මැරීමේ තනි අයිතිවාසිකමක් හිමි නැත.

(2) පැමිණිලිකරුත් විත්තිකරුවනුත් ජන සමාජයේ පොදු සාමාජිකයින් වශයෙන් ඉහතකී කුඩාව වරායෙහි මාදැල් යොදා මසුන් මැරීමට එක සමාන අයිතිවාසිකම් ඇත්තෝ වෙති.

ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙම තීන්දුව පැහැදිලි ලෙසම සිහි තබා ගනිමින්, ගැටීම් මඟහරවන්නාවූත් මහජනතාවට හිතකරවූත්, ඒ ඒ කණ්ඩායම්වල පොදු ලාභ ප්‍රයෝජන රැක දෙන්නාවූත් අන්දමට සම්මුති නීතිය පිට ඇති පොදු අයිතිවාසිකම් බෙදා හැරීමෙහි ලා බල පවත්වන කරුණු කෙරෙහිත්, ආරාවුල් නැති කරණ අතරම බහුල ලෙස මාළු සැපයීමක් ඇති කරන්නාවූ සාධාරණ බෙදුම් මිම්මක් සාක්ෂිවල දක්වා ඇති නොයෙකුත් ක්‍රියා මාර්ගයන් අතරින් සොයා ගැනීම කෙරෙහිත්, දැන් සිත යොමු කළ යුතුව ඇත.

මෙම පරීක්ෂණයෙහිදී මම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේත් රාජනීතිඥයින්ගේ සහ නීතිඥ වෘත්තියේ යෙදුණු වෙනත් උදවියගේත් දීර්ඝ කාලීන අත්දැකීම් වලින් හා බොහෝදුර මෙනෙහි කිරීමෙන් ඔප් නැඟුණු අදහස් පිළිබඳව අවබෝධයක් ඇති කරගැනීමේ වාසනාව ලැබුවෙමි. ඔවුන්ගෙන් ලැබුණු මෙම සහායට මගේ කෘතඥතාවය පිරිනැමෙන බව මෙම අවස්ථාවේදී මෙහිම සටහන් කරනු කැමැත්තෙමි.

කුරේ මහත්මියගේත් ඇගේ සොහොයුරු ඒ. ඒ. අරසකුලරත්නගේත් රසීම් සහ අනිත් අයගේත් අයිතිවාසිකම් ගැන සළකා බැලීම දැන් පහසුවන්නේය. සැළකීමට භාජනය කළ යුත්තේ ඔවුන් දැන් ඉදිරිපත් කරන අයිතිවාසිකම් පමණකි. ඔවුන්ගේ අයිතිවාසිකම් මෙරටෙහි වෙනත් ඕනෑම පුරවැසියෙකුගේ අයිතිවාසිකම්වලට සමාන වන්නේය. ඇගේ දැල් විකුණා දමා ඇතිබව කුරේ මහත්මිය පිළිගත්තාය. ඇගේ දැල් කපා දමනු ලැබී යයි කියා සිටීමෙන් පමණක් ඇ දැන්, ඇ විසින්ම අත්හැර දමනු ලැබූ අයිතිවාසිකමක් යළිත් මතු කරන්නීය. 1945 න් පසුව යාත්‍රාවක් වත් දලක්වත් ඇ සතුව නොතිබුණි. ඇගේ පාරුව කපා දමනු ලැබූ දා පටන් ඇ කිසිම ස්ථානයක මසුන් මැරවීම නොකළාය. ඇ කියා සිටින්නේ ඇට අයිතිවාසිකමක් ලැබෙතොත් ඇ යාත්‍රාවක් මිලදී ගන්නා බවය. ජේරාඩ් මැදප්පුලි, පැට්රික් සහෝදරයනට විරුද්ධව නඩුවක් පැවරූ අවස්ථාවේදී වත් ඇ තමාගේ අයිතිවාසිකම් තහවුරු කරගැනීම සඳහා ඉදිරිපත් නොවූවාය. තුන්වෙනි විත්තිකරු තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමේදී (අයි. සී. 4) ගෙන හැර දක්වූ ගිවිසුම පිටම තමනටත් ඇති අයිතිවාසිකම් ඉල්ලමින් ඇ වෙනම නඩුවක් පැවරීමද නොකළාය. කරුණු මෙසේ හෙයින් මාදැල් එලීමෙන් මසුන් මැරීමේ වාරයක් ලබාගැනීම සඳහා ඇ ඉදිරිපත් කරන අයිතිවාසිකම, යාත්‍රා සහ දැල් අයිතිව ඇත්තාවූත්, ඇයට වඩා මේ පිළිබඳව සෙවිල්ලෙන් සිටියාවූත් අයගේ අයිතිවාසිකම් හමුවේ යටපත් වී යයි.

මේ හා සමාන හේතු සහ සැලකුම් නිසා පැට්රික් සහෝදරයනගේත් ජේරාඩ් මැදප්පුලිගේත් අයිතිවාසිකම්, රසීම්, ඇම්. ඩී. ජේ. අරසකුලරත්න සහ ඔහුගේ සොහොයුරාගේත් අයිතිවාසිකම්වලට වඩා ඉස්මතු වෙයි.

මසුන් මැරීමේ යෙදෙන පුද්ගලයින් හෝ කණ්ඩායම් අතරේ ආරාවුලක් ඇති නොවීයැයි කියමින් වීරසූරිය මහතා සහ ඔහුගේ සහකාරයෝ විරුද්ධත්වයක් මතු කළහ. මෙම විරෝධයෙන් පලක් නැතැයි මට හැඟේ. ආරාවුලක් ඇතිවීයැයි ගරු ඇමතිතුමාට ඒත්තු ගියත් නොගියත් විසඳීම සඳහා මට භාර කරන ලද කරුණු මඟ හරවා මෙම පරීක්ෂණය පැවැත්වීමට ගරු ඇමතිතුමා කළ තීරණය ගැන ප්‍රශ්න කිරීම මා සතු කාර්යක් නොවේ. මගේ පුද්ගලික අදහස නම්, පරීක්ෂාකර බලා වාර්තාවක් සැපයීම අවශ්‍ය වූ තදබල ආරාවුලක්, පුද්ගලයින් සහ කණ්ඩායම් අතරේ ඇත්ත වශයෙන්ම ඇති වූ බවට, වුවමනාවටත් වඩා බොහෝ සාක්ෂි ඇති බවය.

පාරිභෝගික ජනතාවට මාළු සැපයීමෙහි ලා ඉතා වටිනාකමක් ඇති වරායකි, කුඩාව වරාය. මසුන් මැරීම කළ හැකි කාලය තුළදී සෑම දිනකදීම සුලභ වශයෙන් මාළු සැපයීමක් ඇති කිරීම සඳහා කළ හැකි හැම දෙයක්ම කළ යුතුය. හැකියාවත්, නිපුණත්වයත්, ආම්පන්නත් ඇති ඕනෑම කෙනෙකුට මසුන් මැරීම සඳහා වාරයක් දිය යුතුයැයි එකඟ වී ඇත.

මාදැල් එලීම්, එම දැල් එලන්නාටත්, පාරිභෝගික ජනතාවටත් ලාභ ප්‍රයෝජන සහිත විය යුතුය. බොහෝ වියදම් දැරිය යුතු ආයතනයක් පවත්වාගෙන යැම මාදැල් එලන්නා විසින් කළ යුතුව ඇත. මේ අන්දමේ මසුන් ඇල්ලීම පිළිබඳ නිපුණත්වයක් ඔහුට තිබිය යුතුය. ඔහු සෑහෙන මූලධනයක් යට කිරීමට හැකි අයෙක් විය යුතුය.

වීරසූරිය මහතා, තමාගේ ආරම්භක දේශනයෙහිදී නියම ධීවර කාර්මිකයින් කුඩාව වරායෙහි මසුන් ඇල්ලීම සඳහා අයිතිවාසිකම් ඉල්ලා සිටීම ගැන විරුද්ධත්වයක් නොමැති බවත් මුහුදු යා හැකි තත්ත්වයේ ඇති යාත්‍රාවක් සහ දලක් අයිති ඕනෑම කෙනෙකුට මෙම අයිතිවාසිකම ප්‍රතික්ෂේප නොකළ යුතු බවත් කියා සිටියේය. ජේරාඩ් මැද්ප්පුලි හට මසුන් මැරීමේ වාරයක් හිමි වනවාට විරුද්ධත්වයක් නොමැති බවද ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

ජේරාඩ් මැදප්පුලි තම සාක්ෂියෙහිදී ඔහුට දැනටමත් පාරුවක් සහ දලක් හිමිව ඇති බවත් 1961 දෙසැම්බර් 15 දාට පමණ නිමවේයැයි බලාපොරොත්තුවන තවත් පාරුවක් සහ දලක් තනාගෙන යන බවත් කීවේය. යමෙක් දින තුනක් සම්පූර්ණයෙන්ම මාළු අල්ලතොත් ඔහුට පාරු දෙකක් සහ දැල් දෙකක් තිබීම සෑහෙන බවද ඔහු වැඩි දුරටත් කියා සිටියේය.

තුන්වන "පොල" ක්‍රියාත්මක වනුයේ කලාතුරකින් බවත් මසුන් මරණ සම්පූර්ණ කාල සීමාව තුළදීම තුන්වන වාරය ක්‍රියාත්මක වන්නේ දළ වශයෙන් දින 10 කට පමණක් බවත් කියා සිටින ලදී. මාදැල් යොදා මසුන් ඇල්ලීම සඳහා තුන්වන "පොල" යෝග්‍ය නොවන බවටද බොහෝ සාක්ෂි විය. මේ හේතුවෙන් යමෙකුට පාරුවක් සහ දැල් දෙකක්- ඇතොත් ඔහුට එක් දවසක පළමුවැනි සහ දෙවැනි "පොල" වල් ක්‍රියාකරවීම අපහසු නොවන්නේය.

තමා අතිරේක පාරුවක් සහ අතිරේක දලක් තනාගෙන යන බවට ජේරාඩ් මැදප්පුලි කී වැඩිදුර සාක්ෂියද ඇත. "අතිරේක පාරුව සහ දැල ඇති විට මට දින හතරක් පමණක් නොව සම්පූර්ණ දින හය තුළදීම මසුන් ඇල්ලීම කළ හැකිය"යි ඔහු කීවේය.

වීරසූරිය මහතා, පාරුවක් සහ දලක් එක් ඒකකයක් ලෙස අප විසින් ගණන් ගැණෙතොත් එක් පාරුවක් සහ එක් දලක් ක්‍රියා කරවන්නාහට පොලවල් තුනෙන් එක් පොලක් හිමිවුව මනායැයි කියා සිටියේය. ඒ පදනම පිට පාරු දෙකක් සහ දැල් දෙකක් හිමිවන ජේරාඩ් මැදප්පුලි වැනි පුද්ගලයෙකු හට පොලවල් තුනෙන් දෙකක් හිමිවන අතර තුන්වන පොලෙන් එතරම් ප්‍රයෝජනයක් ඇති නොවේ.

මසුන් මැරීමේ වාර බෙදා දීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් දිනවලට වඩා පොලවල් ලාභ සහිත වන්නේ කෙසේදැයි පෙන්නුම්කර දීමට පැට්රික් සහෝදරයෝ සියළු දෙනාම නොනවත්වාම හැම අතටම ගැඹුරු ලෙස කරුණු ගෙනහැර පෑහ. දිනවලට වඩා පොලවල් ලාභ සහිත බවත්, ප්‍රයෝගික බවත් ව්‍යවහාරික බවත් හුවා දැක්වීම සඳහා නීත්‍යානුකූලවූත් මුදල් පිළිබඳ වූත් දේශපාලනමයවූත් සිතා ගත හැකි හැම තර්කයක්ම උපයෝගී කර ගන්නා ලදී. එහෙත් එකී හැම තර්කයක්ම ඉදිරිපත් කරන ලද්දේ ජේරාඩ් මැදප්පුලිහට ඔහුගේ වාරය ලබා ගැනීම සඳහා පොලවල් අනුව ක්‍රියා කිරීමට සිදුවුවහොත් ඔහුට විරුද්ධව හිතාමතා පිළියෙළ කරගන්නා ලද අන්දමකට ක්‍රියා කිරීමේ පරම චේතනාව පිට බව නිසැකවම මට හැඟී ගියේ ය. වාර බෙදාදීම දින අනුව කළහොත් මාදැල් එලීම් වලදී ගැටීම් අඩුවන අතර සාමය රැකීමට උපකාරී වන බවද මට පෙනී ගියේ ය.

මේ සම්බන්ධයෙන් මාදැල් එලීමෙහි පරණ පළපුරුදුකාරයින් වන ටී. ඇම්. ආර්. කුරේ සහ පැට්රික් සහෝදරයින් අතරේ අත්සන් කරගන්නා ලද සංශෝධිත ගිවිසුම (අයි. සී. 10) කෙරෙහි අවධානය යොමු කරනු කැමැත්තෙමි. මීට අමතරව, උප දිසාපතිවරයා විසින්ද අනුමත කරනු ලැබ 1947. 5. 21 දින පැට්රික් සහෝදරයනුත් ඔවුන්ගේ මවත් අතරේ ඇති කරගනු ලැබූ පවුලේ සම්මුතිය අනුවද වාර බෙදා ගෙන ඇත්තේ දින අනුව මිස පොලවල් අනුව නොවේ. දිස්ත්‍රික් උසාවියේ අංක 26779 දරණ නඩුවේදී තුන් වැනි විත්තිකරු විසින් දෙනලද්ද සාක්ෂියෙහිද (අයි. සී. 11) "අප පවුලේ සම්මුතියෙහි, එනම් දෙවැනි ගිවිසුමෙහි, දින හය අප පවුලේ හය දෙනා අතරේ බෙදා ගන්නා ලදැ" යි කියැවේ. දින අනුව වාර බෙදීම මාදැල් එලීම්වලදී සමගියත් සාමයත් රැකීමට උපකාරී වන බවට වැඩිපුර සාධක වශයෙන් ඇස්. ඩී. පැට්රික්ගේ සහෝදරයෙක් වන ඇස්. ඩී. ඇන්ඩෘ විසින් ධීවර අධ්‍යක්ෂ වෙත යවන ලද "X" ලකුණු කර ඇති 1961. 9. 29 දින දරන ලිපියෙහි දක්වා ඇති කරුණු කෙරෙහිද සැලකිල්ල යොමු කරවනු කැමැත්තෙමි. මේ ලිපිය අනුව ඔහු 1946 යේ සිට රු. 8000 පමණ වටිනා යාත්‍රාවක සහ දලක අයිතිකරුවෙක් වන්නේය. "පොල" ක්‍රමය ක්‍රියාත්මක කරවීම අපහසු හෙයින් දලක් සහ යාත්‍රාවක් අයත් සෑම අයෙකුටම මෙම වරායෙහි මසුන් මැරීම සඳහා සතියකට දිනය බැගින් දෙන ලෙස ඔහු ඉල්ලා සිටී.

ඉරිදා සහ ආගමික උත්සව දින සම්බන්ධයෙන් මට හැඟී යන්නේ එම දිනයන්හි මාදැල් යොදා මසුන් මැරීමට කැමති අය එසේ කළ හොත් එය මහජනතාවගේ යහපත සඳහා වන බවයි.

මා හමුවේ කියා සිටින ලද සියළුම සාක්ෂිත් ගෙන හැර දක්වන ලද සියළුම කරුණුත් සලකා බලා ගරු ඇමතිතුමා වෙත මා ඉදිරිපත් කරන නිර්දේශයන් මෙසේ යි :

(අ) කුඩාව වරාය බොක්කේ මසුන් අල්ලන කාල සීමාව ඔක්තෝබර් මස පළමුවැනි දින පටන් ගෙන ඊළඟ අවුරුද්දේ අප්‍රේල් 30 වැනිදා අවසන් වේයැයි සලකනු ලැබේ.

(ආ) මසුන් අල්ලන කාලසීමාව තුළදී මාදැල් එලීම සඳහා "දිනය"ක් පෙ. ව. 5.00 ට ආරම්භ වී ප. ව. 5.00 ට අවසන් වෙයි.

(ඇ) කුඩාව වරාය බොක්කේ ජලාශය තුල කිසිම මාදැලක් පෙ. ව. 5.00 ට පෙර හෝ ප. ව. 5.00 ට පසුව නොතිබිය යුතුය.

(ඈ) මසුන් අල්ලන කාල සීමාව තුළදී මසුන් ඇල්ලීම සඳහා වාර බෙදිය යුත්තේ දින අනුව මිස පොලවල් අනුව නොවේ. එවිට :-

(i) ඔක්තෝබර් පළමුවැනිදසින් පටන් ගෙන ඊළඟ අවුරුද්දේ අප්‍රේල් 30 වැනිදසින් අවසන්වන කාලය තුල සෑම සතියකම සෑම බ්‍රහස්පතින්දා දිනයක්ම මාදැල් එලා මසුන් මැරීම සඳහා සී. ඩී. ජේරාඩ් මැදප්පුලි, ඇස්. ඩී. කාමෙල් මැදප්පුලි සහ ඇස්. ඩී. ස්ටිවන් මැදප්පුලි යන අයවළුන් හට පවරනු ලැබේ.

(ii) යට දක්වන ලද අන්දමට සෑම සතියකම සෑම **සඳුදා** දිනයක්ම ඇස්. ඩී. පැට්රික් හට පවරනු ලැබේ.

(iii) යට දක්වන ලද අන්දමට සෑම සතියකම සෑම **අඟහරුවාදා** දිනයක්ම ඇස්. ඩී. ඇන්ඩෘ හට පවරනු ලැබේ.

(iv) යට දක්වන ලද අන්දමට සෑම සතියකම සෑම **බදාදා** දිනයක්ම ඇස්. ඩී. ජුවාන් හට පවරනු ලැබේ.

(v) යට දක්වන ලද අන්දමට සෑම සතියකම සෑම **සිකුරාදා** දිනයක්ම ඇස්. ඩී. ජේරාඩ් සහ ඇස්. ඩී. මයිකල් යන අයවළුන් හට පවරනු ලැබේ.

(vi) යට දක්වන ලද අන්දමට සෑම සතියකම සෑම **සෙනසුරාදා** දිනයක්ම ඇනා මැදප්පුලි හට පවරනු ලැබේ.

(ඉ) ආගමික උත්සව දිනයක්, ඉරිදා හැර වෙනත් දිනයකට යෙදෙතොත් එම දිනය පවරනු ලැබූ අයට, මාදැල් යොදා මසුන් මැරීම පිණිස එදිනට ඉදිරිපත් වන වෙන ඕනෑම කෙනකු හට තම වාරය පැවරිය හැක.

(ඊ) ඉරිදා දිනයන් පහත දක්වා ඇති ලෙස මාරුවෙන් මාරුවට ඊ. ඇම්. ආර්. කුරේ මහත්මියටත්, රයිමි මහතාටත්, ඇම්. ඩී. ජේ. අරසකුලරත්න මහතාටත් (ජයවීර මහතා ඔහුගේ අයිතිවාසිකම් කියා පෑම ඉල්ලා අස් කරගෙන ඇත.) පවරනු කැමැත්තෙමි.

එනම් :- මසුන් මැරීමේ කාලසීමාවේ මුල්ම සතියේ පළමුවන ඉරිදා දිනය රයිමි මහතාටත් ඊළඟ ඉරිදා දිනය කුරේ මහත්මියටත් ඊටත් පසුව එන ඉරිදා දිනය ඇම්. ඩී. ජේ. අරසකුලරත්න මහතාටත් යනාදි වශයෙන් අනුපිළිවෙළිනි.

මෙම නිර්දේශයන් සම්මත කර ගනිතොත් අවුරුදු දෙකකින් පසුව යළිත් සලකා බැලීම මැනැවැයිද ගරු ඇමතිතුමාට යෝජනා කරනු කැමැත්තෙමි.

ආර්. ද සොයිසා,
කොමසාරිස්.

1962 පෙබරවාරි 28 දී.

3-475

---

## 1958 අංක 45 දරණ විද්‍යෝදය විශ්ව විද්‍යාලය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය පනත

### 4 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරලයේ වේවැල්දූව හා වරාකනත්ත යන ගම්වල පිහිටි මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය සඳහා අවශ්‍ය බව 1958 අංක 45 දරණ විද්‍යෝදය විශ්ව විද්‍යාලය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය පණතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යාපන හා ගුවන් විදුලි පිළිබඳ ඇමතිවරයා වූ බදිඋද්දින් මහමුද් නමැති මම මෙයින් දැනුම් දී සිටිමි.

1 වේවැල්දූව නම් ගමේ පිහිටා ඇති ජේ. ඒ. ඩී. එලිසබෙත් සහ දරුවන් හිමිකම් කියන අක්කර 1/8 ක් පමණ වන දවටගහ වත්තට මායිම් :—

උතුරට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; දකුණට : කොළඹ-නුවර මහ පාර ; නැගෙනහිරට : ඩී. ඇෆ්. ජේ. පෙරේරා යන අයට අයත් දවටගහ වත්ත යන ඉඩම ; බස්නාහිරට : ඇම්. ඒ. ස්ටැනිස්ලෝස් ඩයස් ට අයත් දවටගහවත්ත යන ඉඩම.

2 වේවැල්දූව නම් ගමේ පිහිටා ඇති ඩී. ඇෆ්. ජේ. පෙරේරා යන අය හිමිකම් කියන අක්කර 1/8 ක් පමණ වන දවටගහවත්තට මායිම් :—

උතුරට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; දකුණට : කොළඹ-නුවර මහ පාර ; නැගෙනහිරට : වේවැල්දූවට යන පාර ; බස්නාහිරට : ජේ. ඒ. ඩී. එලිසබෙත් නැමැත්තීට අයත් දවටගහ වත්ත.

3 වරාකනත්ත නම් ගමේ පිහිටා ඇති ඩී. ඇෆ්. ජේ. පෙරේරා යන අය හිමිකම් කියන අක්කර 3/4 ක් පමණ වන කෝන්ගහවත්ත නමැති ඉඩමට මායිම් :—

උතුරට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; දකුණට : කොළඹ-නුවර මහ පාර ; නැගෙනහිරට : ඇන්තනි ජෝශප් විජේතුංග යන අයට අයත් කෝන්ගහවත්ත යන ඉඩම ; බස්නාහිරට : වේවැල්දූවට යන පාර.

4 වේවැල්දූව නම් ගමේ පිහිටා ඇති එච්. මර්තිනා ඩයස් සහ ඩබ්ලිව්. කේ. ඇස්. පෙරේරා යන අය හිමිකම් කියන පර්චස් 10.22ක් පමණ වන මිල්ලගහවත්ත නොහොත් ගොඩැල්ලපිටගේන නමැති ඉඩමට මායිම් :—

උතුරට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; දකුණට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; නැගෙනහිරට : හුණුපිටියේ පදිංචි සීමෙන් පීරිස් නොහොත් සයිමන් පීරිස් යන අයට අයිති ඉඩම ; බස්නාහිරට : ඩබ්ලිව්. කේ. එමලි මැවිල්ලාට අයත් කදුරුගහවත්ත යන ඉඩම.

5. වේවැල්දූව නම් ගමේ පිහිටා ඇති හුණුපිටියේ පදිංචි සීමන් පීරිස් නොහොත් සයිමන් පීරිස් යන අය හිමිකම් කියන පාර්චස් 30.68 ක් පමණ වන මිල්ලගහවත්ත නොහොත් ගොඩැල්ලපිටගේන නමැති ඉඩමට මායිම් :—

උතුරට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; දකුණට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; නැගෙනහිරට : එච්. ඇලිස් පෙරේරාට සහ ඒ. මිගෙල් පෙරේරාට අයිති ඉඩම ; බස්නාහිරට : එච්. මර්තිනා ඩයස්ට සහ ඩබ්ලිව්. කේ. ඇස්. පෙරේරාට අයිති ඉඩම.

6. වේවැල්දූව නම් ගමේ පිහිටා ඇති ඒ. මිගෙල් පෙරේරා යන අය හිමිකම් කියන පාර්චස් 15.34 ක් පමණ වන මිල්ලගහවත්ත නොහොත් ගොඩැල්ලපිටගේන නමැති ඉඩමට මායිම් :—

උතුරට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; දකුණට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; නැගෙනහිරට : එච්. ඇලිස් පෙරේරාට අයිති මෙම ඉඩමේ කොටස ; බස්නාහිරට : හුණුපිටියේ පදිංචි සීමොන් පීරිස් නොහොත් සයිමන් පීරිස්ට අයිති ඉඩම.

7. වේවැල්දූව නම් ගමේ පිහිටා ඇති එච්. ඇලිස් පෙරේරා යන අය හිමිකම් කියන පාර්චස් 15.34 ක් පමණ වන මිල්ලගහවත්ත නොහොත් ගොඩැල්ලපිටගේන නමැති ඉඩමට මායිම් :—

උතුරට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම : දකුණට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; නැගෙනහිරට : එච්. තෝමස් පෙරේරාට අයිති මෙම ඉඩමේ කොටස ; බස්නාහිරට : ඒ. මිගෙල් පෙරේරාට අයිති මෙම ඉඩමේ කොටස.

8. වේවැල්දූව නම් ගමේ පිහිටා තිබෙන ඇම්. තෝමස් පෙරේරා යන අය හිමිකම් කියන පාර්චස් 30.68 ක් පමණ වන මිල්ලගහවත්ත නොහොත් ගොඩැල්ලපිටගේන නමැති ඉඩමට මායිම් :—

උතුරට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; දකුණට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; නැගෙනහිරට : ඒ. කේ. සැමුවෙල් පෙරේරාට අයිති මෙම ඉඩමේ කොටස ; බස්නාහිරට : එච්. ඇලිස් පෙරේරාට අයිති මෙම ඉඩමේ කොටස.

9. වේවැල්දූව නම් ගමේ පිහිටා තිබෙන ඒ. කේ. සැමුවෙල් පෙරේරා යන අය හිමිකම් කියන පාර්චස් 5.11 ක් පමණ වන මිල්ලගහවත්ත නොහොත් ගොඩැල්ලපිටගේන නමැති ඉඩමට මායිම් :—

උතුරට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; දකුණට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; නැගෙනහිරට : ඇස්. ඒ. පෙරේරාට අයත් මෙම ඉඩමේ කොටස ; බස්නාහිරට ඇම්. තෝමස් පෙරේරාට අයත් මෙම ඉඩමේ කොටස.

10. වේවැල්දූව නම් ගමේ පිහිටා තිබෙන ඇස්. ඒ. පෙරේරා යන අය හිමිකම් කියන පාර්චස් 25.57 ක් පමණ වන මිල්ලගහවත්ත නොහොත් ගොඩැල්ලපිටයේන නමැති ඉඩමට මායිම් :—

උතුරට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; දකුණට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; නැගෙනහිරට : කුරුවිට ආරච්චිගේ දෝන ජොස්ලින් විජේසිංහට සහ එමගේ ඇග්නස් විජේසිංහට අයිති මෙම ඉඩමේ කොටස ; බස්නාහිරට : ඒ. කේ. සැමුවෙල්ට අයත් මෙම ඉඩමේ කොටස.

11. වේවැල්දූව නම් ගමේ පිහිටා ඇති කුරුවිට ආරච්චිගේ දෝන ජොස්ලින් විජේසිංහ සහ ඇග්නස් විජේසිංහ යන අය හිමිකම් කියන පාර්චස් 20.45 ක් පමණ වන මිල්ලගහවත්ත නොහොත් ගොඩැල්ලපිටයේන නමැති ඉඩමට මායිම් :—

උතුරට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; දකුණට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; නැගෙනහිරට : කුරුවිට ආරච්චිගේ දෝන ඇලිස් විජේසිංහට අයිති මෙම ඉඩමේ කොටස ; බස්නාහිරට : ඇස්. ඒ. පෙරේරාට අයිති මෙම ඉඩමේ කොටස.

12. වේවැල්දූව නම් ගමේ පිහිටා ඇති කුරුවිට ආරච්චිගේ දෝන ඇලිස් විජේසිංහ නමැති අය හිමිකම් කියන පාර්චස් 10.22 ක් පමණ වන මිල්ලගහවත්ත නොහොත් ගොඩැල්ලපිටයේන නමැති ඉඩමට මායිම් :—

උතුරට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; දකුණට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; නැගෙනහිරට : මේරි ඇග්නස් ද ලිවේරා යන අයට අයත් මේ ඉඩමේ කොටස ; බස්නාහිරට : කුරුවිට ආරච්චිගේ දෝන ජොස්ලින් විජේසිංහට සහ ඇග්නස් විජේසිංහට අයත් මේ ඉඩමේ කොටස.

13. වේවැල්දූව නම් ගමේ පිහිටා ඇති මේරි ඇග්නස් ද ලිවේරා නමැති අය හිමිකම් කියන පාර්චස් 51.12 ක් පමණ වන මිල්ලගහ වත්ත නොහොත් ගොඩැල්ලපිටයේන නමැති ඉඩමට මායිම් :—

උතුරට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; දකුණට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අයත් ඉඩම ; නැගෙනහිරට : වේවැල්දූවට යන පාර ; බස්නාහිරට : කුරුවිට ආරච්චිගේ දෝන ඇලිස් විජේසිංහට අයිති මේ ඉඩමේ කොටස.

14. වේවැල්දූව නම් ගමේ පිහිටා ඇති අතුකෝරලගේ දොන් ඩේවිඩ් යන අය හිමිකම් කියන පාර්චස් 10 ක් පමණ වන මිල්ලගහ වත්ත යන ඉඩමට මායිම් :—

උතුරට : ඇස්. ඒ. පෙරේරා යන අයට අයත් හැඩවකගහවත්ත යන ඉඩම ; දකුණට : ඇස්. ඒ. පෙරේරා යන අයට අයත් හැඩවකගහවත්ත යන ඉඩම ; නැගෙනහිරට : ඇස්. ඒ. පෙරේරා යන අයට අයත් හැඩවකගහවත්ත යන ඉඩම ; බස්නාහිරට : වේවැල්දූවට යන ගම්සභා පාර.

15. වේවැල්දූව නම් ගමේ පිහිටා ඇති ඇස්. ඒ. පෙරේරා යන අය හිමිකම් කියන අක්කර 6, රූඩ් 0, පාර්චස් 36ක් පමණ වන හැඩවකගහවත්ත නම් ඉඩමට මායිම් :—

උතුරට : හෙට්ටි ආරච්චිගේ පීරිස් පෙරේරා, හෙට්ටිආරච්චිගේ තෝමස් පෙරේරා හා ඩී. ඇෆ්. ජේ. පෙරේරා යන අයට අයත් ඉඩම් ; දකුණට : අතුකෝරලගේ ඩේවිඩ්ට අයත් ඉඩම සහ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය අයත්කරගෙන ඇති ඉඩම ; නැගෙනහිරට : ඇස්. ඒ. පෙරේරාට අයත් ගොඩැල්ලපිටයේන නමැති ඉඩම ; බස්නාහිරට : රණතුංග ආරච්චිගේ මාටින් පෙරේරාට අයත් ඉඩම, අතුකෝරලගේ දොන් ඩේවිඩ්ට අයත් ඉඩම සහ වේවැල්දූවට යන පාර.

16. වේවැල්දූව නම් ගමේ පිහිටා ඇති ඇස්. ඒ. පෙරේරා යන අය හිමිකම් කියන මිල්ලගහවත්ත නොහොත් ගොඩැල්ලපිටයේන නමැති ඉඩමෙන් අක්කර දෙකකට පමණක් මායිම් :—

උතුරට මිණිකනත්ත ; දකුණට : විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට ලබාගෙන ඇති ඉඩම ; නැගෙනහිරට : ඇස්. ඒ. පෙරේරාටම අයත් මෙම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : ඇස්. ඒ. පෙරේරාට අයත් හැඩවකගහවත්ත නම් ඉඩම.

17. වේවැල්දූව නම් ගමේ පිහිටා ඇති ඩී. ඇෆ්. ජේ. පෙරේරා යන අය හිමිකම් කියන අක්කර 3 1/2ක් පමණ වන පරණවත්ත නමැති ඉඩමට මායිම් :—

උතුරට බී. ඒ. ඇසිලින් නෝනාට සහ තව අයට අයත් තනිපොල්ගහවත්ත නොහොත් ප්‍රංශ වත්ත නොහොත් පරණ වත්තේ කොටස ද ; දකුණට : ඇස්. ඒ. පෙරේරාට අයත් මිල්ලගහවත්ත ; නැගෙනහිරට : මිනිකනත්ත ; බස්නාහිරට : එච්. තෝමස් පෙරේරා යන අයට අයත් මිල්ලගහවත්ත නමැති ඉඩම.

බදිඋද්දීන් මහමූද්,
අධ්‍යාපන හා ගුවන් විදුලි ඇමති.

අංකය : කේ/සී 19,
කොළඹ 3, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවතේ,
" සිරිමතිපායේ ",
අධ්‍යාපන හා ගුවන් විදුලි ඇමති කාර්යාලයේදීය,
1962 මාර්තු 5,

3-570

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## දැන්වීමයි

### මරුතමුනෙයි (කරවලෙයි) ධීවර රෙගුලාසි
### බලපත්‍ර සඳහා ඉල්ලුම් කිරීම

අංක 12,553 සහ 1961 ජූලි 21 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවෙහි පළ කරන ලද රෙගුලාසි සම්බන්ධවයි.

බල පත්‍ර සඳහා එවන ඉල්ලුම් පත් කල්මුනෙයි ධීවර කාර්යාලයෙන් ලබා ගත හැකිය. මේ සඳහා නියමිත ආකෘති පත්‍ර වල 1962 අප්‍රේල් 10 වෙනි දිනට පෙර මාහට ලැබෙන සේ කල්මුනෙයි උප පරීක්ෂක ගේ මාර්ගයෙන් මා වෙත එවිය යුතුය.

අමතර විස්තර කල්මුනෙයි හි ධීවර උප පරීක්ෂක ගෙන් ලබා ගත හැක.

ඩී. පී. ජී. ඒ. ද පොන්සේකා,
ධීවර අධ්‍යක්ෂ.

3-448

---

## දැන්වීමයි

වර්ෂ 1942 කේ අංක 31 දරන ලංකා ජාතික කෞතුකාගාර ව්‍යවස්ථාවේ 9 වැනි ඡේදය යටතේ පැනවූ රීති අතුරෙන් වර්ෂ 1948 ක්වූ අප්‍රියෙල් මස 30 වැනි දින නිකුත් කරණ ලද අංක 9,859 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණ ලද, සංශොධිත 3 වැනි රීතිය අනුව කොළඹ, මහනුවර, යාපනය සහ රත්නපුර පිහිටා ඇති ජාතික කෞතුකාගාර 1962 ක්වූ අප්‍රියෙල් මස 14 වැනි දින යෙදෙන ප්‍රසිද්ධ නිවාඩු දිනය නිමිත්තෙන් වසා තබන බැව් මෙයින් දන්වනු ලැබේ.

ප. දැරණියගල,
ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ.

1962 මාර්තු 6 වැනි දින,
කොළඹ දී ය.

3-594

---

## ප්‍රකාශනයයි

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තුලාන 22 "ඒ" කොට්ඨාශයේ කුරුන්දන් කුලම ගවයන් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආරියදාස අමරසිංහ වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : මිහින්තලේ අනුරාධපුර මාවත ; දකුණට : ගල්කුලම-අනුරාධපුර මාවත ; නැගනහිරට : ගල්කුලම-මිහින්තලේ මාවත ; බස්නාහිරට : අනුරාධපුර නගර සීමාව.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගව යන් හෝ ගවයන් බඳිනලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිල ධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර කුරුන්දන් කුලම පශු වෛද්‍ය තැන ගෙන් හෝ නුවර පළාත නැගෙනහිර කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන.

1962 පෙබරවාරි 27 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරී තැනගේ කාර්යාලයේදීය.

3-523

## ප්‍රකාශනයයි

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ කිලිනොච්චි පහ පරන්තන් ගම්පති කොට්ඨාශවල පරන්තන් ගමෙහි ගවයන් අතර "ඇන්ත්‍රැක්ස්" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආරියදාස අමරසිංහ වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට: එලිෆන්ට් පාස් ; දකුණට: තුනුක්කායි සහ උඩයිලන් කුලම් ගම්පති කොට්ඨාශය; නැගෙනහිරට: කන්දවලය සහ මුරාසුමෝඩය ගම්පති කොට්ඨාශය; බස්නාහිරට: පූනේරියන් ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර කිලිනොච්චිය පශු වෛද්‍ය තැනගෙන් හෝ කරච්චි තුනුක්කාය කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායසීලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 මාර්තු 2 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායසීලයේදී ය.

3-522

## දැන්වීමයි

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ කෝරච්චි කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ කිලිනොච්චි ගම්පති කොට්ඨාශයේ ගවයින් අතර, "ඇන්ත්‍රැක්ස්" නමැති රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වූ 1961. 7. 7 දින අංක 12 508 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණ ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 පෙබරවාරි 27 වැනි• දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන
පශු වෛද්‍ය කාර්යාලයේදී ය.

3-521

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දුම්මලසූරිය පළාතේ යගම්පත්තු කෝරළයේ සියඹලාරුප්පේ ගවයන් අතර "මව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආරියදාස අමරසිංහ වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට: වතු වත්ත පළාත; දකුණට: හලාවත දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල්හි, මැදගොඩ පළාත; නැගෙනහිරට: කරඳවෙල පළාත සහ පලුගමුව පළාත; බස්නාහිරට: හලාවත දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල්හි ගල්මුරුව පළාත.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර කුලියාපිටිය පශු වෛද්‍ය තැනගෙන් හෝ කටුගම්පොල කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායසීලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 මාර්තු 9 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායසීලයේදීය.

3-382

## රජයේ දුම්රිය සේවය

**දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය වැටී ඇති ස්ථාන අලුත්වැඩියාකිරීම**

ප්‍රධාන මාර්ගයේ ගණේමුල්ල සහ ගම්පහ දුම්රිය ස්ථානයන් අතර හැතැප්ම 13 දම්වැල් 36 දරණ කිරිඳිවිට-කුඩවත මාර්ගය දුම්රිය මාර්ගය හරහා වැටී ඇති ස්ථානය 1962 මාර්තු මස 18 වැනි ඉරිදා රාත්‍රි 10යේ සිට පසුදින සඳුදා උදය 6.00 දක්වා අළුත්වැඩියාකිරීම සඳහා වසා තබනු ලැබේ.

මෙම කාලය තුළදී රථ වාහන ගම්පහ පහළ ඉඹුල්ගොඩ පාරෙන් නුවර පාරට වැටී ගමන් කළ යුතුයි.

3-524

ගල්ඔය සංවර්ධන මණ්ඩලයට අයිතිව තිබූ පහත සඳහන් මාර්ග වල ගෙන ගිය හැකි බර ප්‍රමාණයන් පහත පළවේ :—

| | | | | ගෙන ගිය හැකි වැඩිම බර ප්‍රමාණය ටොන් |
|---|---|---|---|---|
| 1. | අම්පිලන්තුරේ-වීරමුනේ පාර— | | | |
| | සැතපුම් 1 සිට 8 දක්වා. | ... | ... | 1½ |
| | සැතපුම් 8 සිට 16 දක්වා | ... | ... | 5 |
| 2. | පෝරෙයිතිවු-පාලුගාමම්-තුම්පන්කනි පාර | | ... | 1½ |
| 3. | වාවලකඩයි-වාදන්තලාව පාර | ... | ... | 5 |
| | වාදන්තලාව-උහන පාර. | ... | ... | 5 |

සී. මා. පෙරේරා,
ආණ්ඩුවේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

3—411

## රජයේ දැන්වීමයි

**කොම්පඤ්ඤවීදිය, ග්ලෙනී වීදියේ මහා මාර්ගය හරහා දුම්රිය මාර්ගය වැටී ඇති ස්ථානයේ රථවාහන හැසිරවීම**

දැනට මාර්ගය හරහා ඇති ලී ගේට්ටුව වෙනුවට, 1962 ජනවාරි මස 28 වැනි දින සිට, විදුලි මෝටරයකින් ක්‍රියා කරවන හරස් පොලු ගේට්ටුවක් (ලීවර පහතට ක්‍රියා කරවන) සවි කරනවා ඇත. දුම්රිය පාර හරහා ඇති මහා මාර්ගය, රථ වාහන හැසිරවීම සඳහා කොටස් දෙකකට බෙදනු ලැබ, මහා මාර්ගයේ යොදා ඇති වර්ණාලෝක සංඥා ක්‍රමය අනුව, මෙම ගේට්ටුව තුදිරියෙන්ද, වර්ණාලෝක සංඥා සවිකර ඇත. සියලුම රියැදුරන් මෙම සංඥා ක්‍රමයට අවනත විය යුතුය.

යම් අවස්ථාවකදී මෙම වර්ණාලෝක සංඥා ක්‍රමය ක්‍රියා විරහිත වුවහොත්, මෙම ස්ථානයේදී කරනු ලබන අත් සංඥා වලට සියලුම රියැදුරන් අවනත විය යුතුය.

3-471

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවනු ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි